ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>මහ **කොමසාරිස්තුමා** මධ්‍යම පළාතේ ඉන්දීය සම්භවයක් සහිත සිසු දරු දැරියන් සහ වතු කම්කරුවන් සඳහා බහු **ආංශික** සහය පිරිනමයි</u>

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා මධ්‍යම පළාතේ සිදු කළ සංචාරය අතරතුර 2025 මැයි 15 වන දින පැවති උත්සව දෙකකදී ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාව වෙත බහු ආංශික සහය පිරිනැමුවේය.

2. මහනුවර, පේරාදෙණිය හින්දු විද්‍යාලයේ සංවිධානය කර තිබූ උත්සවයකදී මහ කොමසාරිස්තුමා විද්‍යාලයේ ඉල්ලීම පරිදි සිසු දරුවන් වෙත පරිගණක, සංගීත භාණ්ඩ, පුස්තකාලය සඳහා පොත් සහ ක්‍රීඩා උපකරණ ආදි භාණ්ඩ රැසක් පිරිනැමීය.

3. එදිනම මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව වතුයායේ ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ තෙවන අදියර යටතේ නිවාස ඉදිවන ඉඩම් වෙත ගිය එතුමා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සමඟ කතාබහක නිරත විය. වතුයායේ සේවය කරන පවුල් වෙත වෛද්‍ය උපකරණ සහ වැසි ආවරණ කට්ටල ද එතුමා විසින් බෙදා දෙන ලදී. ඉන්දීය නිවාස ව්‍යාපෘතියේ තෙවන සහ සිව්වන අදියරයන් යටතේ ශ්‍රී ලංකාවේ වතුකර ප්‍රදේශවල ඉදිකරන නිවාස 14000 න් නිවාස 25ක් ඇල්කඩුව වතුයායේ ඉදි කෙරේ.

4. මෙම අවස්ථා දෙකෙහිදීම මහ කොමසාරිස්තුමා ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාවගේ සහ ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතාවයන් සහ ප්‍රමුඛතාවයන් මත පදනම්ව එම ප්‍රජාව වෙත හැකි සෑම සහයෝගයක්ම ලබාදීමට ඉන්දීය රජය අඛණ්ඩව කැප වී සිටින බව අවධාරණය කළේය. දැනට ක්‍රියාත්මක ඉන්දීය නිවාස ව්‍යාපෘතියට අමතරව වතුකර පාසල්වල සුහුරු පන්ති කාමර 60ක් ස්ථාපිත කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම, වතුකර පාසල් 9ක් නවීකරණය කිරීම සඳහා ඉන්දීය රජය විසින් ලබා දෙන ආධාර දෙගුණ කිරීම සහ ඉන්දීය අග්‍රාමාත්‍යතුමා 2025 අප්‍රේල් මාසයේ සිදු කළ ශ්‍රී ලංකා නිල සංචාරය අතරතුර දී නිවේදනය කළ පරිදි සීතා එළිය කෝවිල සංවර්ධනය කිරීම ඇතුළු විවිධ ව්‍යාපෘතීන් පිළිබඳව මහ කොමසාරිස්තුමා මෙහිදී සිහිපත් කළේය.

5. ඉන්දීය සම්භවයක් සහිත දමිළ ප්‍රජාව ශ්‍රී ලංකාවට පැමිණ වසර 200ක් ගතවීම නිමිත්තෙන් ප්‍රකාශයට පත් කරන ලද ඉන්දීය රුපියල් මිලියන 750ක බහු ආංශික ප්‍රදාන පැකේජය යටතේ ශ්‍රී ලංකා රජයේ සහයෝගය ඇතිව නව ව්‍යාපෘතීන් ද කඩිනමින්

ක්‍රියාවට නැංවිය හැකි බව එතුමා සඳහන් කළේය. සූර්යබල ලන්තෑරුම්, පාසල් බෑග් සහ පොත් බෙදා දීම සහ වතුකර පාසල්වල ශ්‍රී ලාංකික ගුරුවරුන් 2000කට අධික පිරිසකට ප්‍රතිලාභ ගෙන දෙමින් STEM විෂයන් සම්බන්ධයෙන් විශේෂ ගුරු පුහුණු වැඩසටහනක් පැවැත්වීම වැනි ව්‍යාපෘතීන් දැනටමත් මෙම පැකේජය යටතේ ක්‍රියාවට නංවා ඇත.

***

**කොළඹ**

***2025*** මැයි ***16***